# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: 2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513459, 2513498, 2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: **2018.10.21**

## ප්‍රවෘත්ති නිවේදනයයි

## ආනයනික භාණ්ඩ නිෂ්කාශනය සඳහා බන්දිත ගුදම් පවත්වාගෙන යාමට පෞද්ගලික අංශයටත් අවසර

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන LCL Cargo හෙවත්, බහලුම් ප්‍රමාණයකට වඩා අඩු ප්‍රමාණයකින් ආනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාශනය කිරීමට පහසු වන පරිදි බන්දිත ගුදම් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික අංශයටද අවසරය දීමට රජය තීරණය කර ඇත.

ශ්‍රී ලංකා රේගු ආඥා පනත යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මහතා වෙත පවරා ඇති බලතල අනුව මේ සඳහා වන රෙගුගාසි පනවන ගැසට් නිවේදනයට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පසුගියදා අත්සන් තබන ලදී. ඔක්තෝබර් 01 දා සිට ක්‍රියාත්මක වන මෙම නව රෙගුලාසි අනුව ආනයනික භාණ්ඩ නිෂ්කාශනය පමණක් නොව අපනයන කටයුතු මෙන්ම ප්‍රති අපනයනයද මෙම බන්දිත (Bonded) ගුදම හරහා ක්‍රියාත්මක කළ හැකිය.

ජාත්‍යන්තර වරාය හා ගුවන්තොටුපල සිට සාධාරණ දුර ප්‍රමාණයක් තුළ මෙන්ම භාණ්ඩ නිෂ්කාශනය කරන්නන් හට පහසුවෙන් පිවිසිය හැකි ස්ථානයක මෙම ගුදම පිහිටුවීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් බලපත්‍ර ලබාගත හැකිවේ. මේ සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව වශයෙන් රු. ලක්ෂ 5 ක් අයකරනු ලැබේ.

මේ අතර මහා පරිමාණ ඖෂධ නිෂ්පාදන, කිරි කර්මාන්ත හා කසළ කළමනාකරණය සඳහා වන ආයෝජන වලට අවශ්‍ය ආනයනික ප්‍රාග්ධන භාණ්ඩ සඳහා 2018 අයවැය මගින් යෝජනා කළ පරිදි එම භාණ්ඩ සඳහාද බන්දිත ගුදම් පවත්වාගෙන යාමට අවසර ලබාදී ඇති අතර, මෙම ප්‍රාග්ධන භාණ්ඩ සඳහා බදු නිදහස ද ලබාදී තිබේ.

එම්. අලි හසන්
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය